**'ධ්‍රැවීකරණය වූ ලෝකයක නොබැඳි බව නැවත තක්සේරු කිරීම' යන මැයෙන් 2024 පෙබරවාරි 21 දින ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා සහ ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ (LKI) දී පවත්වන ලද 3 වන සාකච්ඡාව.**

මාස හතරකට වරක් පවත්වනු ලබන මෙම සංසදය විසින් සමකාලීන විදේශ ප්‍රතිපත්ති සහ ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීමටත් ශ්‍රී ලංකාවේ සංවර්ධනයට දායකවීමටත් අවශ්‍ය විශේෂඥයින් එක් රැස් කරයි. ලාංකික සංසදයට පූර්වයෙන් සමාරම්භක දේශනය පැවැත්වූ, විදේශ අමාත්‍ය එම්.යූ.එම්.අලි සබ්රිගේ නිරීක්ෂණය වූයේ, “නොබැඳි යන්නෙන් අදහස් කරන්නේ නරඹන්නෙකු නොවීම” සහ “ස්වෛරී තීරණ ගැනීමට ඔබව බලහත්කාරයෙන් හෝ කඳවුරකට කොටු නොකිරීම යන්න ය”.

ක්ෂේත්‍රයේ ප්‍රමුඛ පෙළේ ප්‍රවීණයන් 4 දෙනෙකු සහභාගී වූ සැසිවාරය මෙහෙයවමින්, LKI විධායක අධ්‍යක්ෂ, තානාපති රවිනාථ ආර්යසිංහ මහතා ආරම්භයේදීම - නොබැඳි ව්‍යාපාරය (NAM) යන්න සංවිධානයක් ලෙසත්, 'නොබැඳි' සංකල්පය විදේශ ප්‍රතිපත්ති උපායමාර්ගයක් ලෙසත්, අවබෝධ කර ගැනීමේ වැදගත්කම අවධාරණය කළේය.. 1960-1980 අතර බොහෝ සාමාජික රටවලට මෙන්ම ශ්‍රී ලංකාවටද NAM විසින් ඉන්දිය සාගර සාම කලාපය, සාගර නීතිය, නව ජාත්‍යන්තර ආර්ථිකය ඇතුළු සිය සාමාජිකත්වයට අදාළ වැදගත් මුලපිරීම්, සංකල්පගත කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදු වූ බව ඔහු සඳහන් කළේය. නව ජාත්‍යන්තර තොරතුරු සැලස්මක් සහ සංවර්ධනය වෙමින් පවතින රටක් ගෝලීය නිරායුධකරණය අවධාරණය කෙරිණි. මෙහිදී  ශ්‍රී ලංකාව වෙත ද ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය.

කෙසේ වෙතත්, සීතල යුද්ධයේ අවසානයත් සමඟම, නොබැඳී පාර්ශ්වයේ සාමාජික රටවල විවිධ අවශ්‍යතා සහ පෙළගැසීම් හේතුවෙන් ගෝලීය කටයුතු කෙරෙහි එතෙක් ඔවුනට තිබූ බලපෑම් කිරීමේ හැකියාව ගිලිහෙන්නට විය. එහෙත් වෙනස්වන ගෝලීය ගතිකත්වයන් සපුරාලීම සඳහා නොබැඳි බව නැවතත් සක්‍රීය කරලීමේ අවශ්‍යතාවය පිළිබඳව මෑත කාලීනව නිරන්තරයෙන් සාකච්ඡා වූ කළ ද, NAM රටවල් මේ සම්බන්ධයෙන් ඒකාබද්ධ උපායමාර්ගික ප්‍රතිචාරයක් දැක්වීමට හෝ නැවත ඒ සඳහා වන ගමන් මාර්ගයක් සකසාගැනීමටත් අපොහොසත් වූයේය යන්න ඔහු ගේ නිරීක්ෂණය විය.මෑත කාලීන අර්බුද වලදී - විශේෂයෙන් යුක්රේනය සහ ගාසා තීරයේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ NAM රටවල ඡන්ද රටාවන්, නොබැඳි රාජ්‍යයන්ගේ තත්කාලීන ගැටලුවලට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද, යන්න විනිශ්චය කිරීමට බැරෝමීටරයක් සපයන බව පවසන, ආර්යසිංහ මහතා, ප්‍රතිදිශානුගත වූ නොබැඳි ප්‍රතිපත්තියක් පිළිබඳව වඩාත් සමීප අධ්‍යයනයක අවශ්‍යතාව අවධාරණය කළේය.

බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානයේ (BCIS) විධායක අධ්‍යක්ෂ මහාචාර්ය ගාමිණී කීරවැල්ල, NAM හි විකාශනය කෙරෙහි අවධානය යොමු කරමින්, එයට අවධීන් 3ක් තිබූ බව අවධාරණය කළේය. පළමුවැන්න යටත් විජිතකරණය, දෙවැන්න සීතල යුද්ධයේ අභියෝගවලට මුහුණ දීමට සිදුවීම. සහ තෙවනුව පශ්චාත් සීතල යුද ගතිකත්වය සමඟ පොරබැදීමට සිදුවීමය . අගමැති ඩී.එස්. සේනානායකගේ මධ්‍යස්ථභාවය එක්සත් රාජධානිය සමඟ ආරක්ෂක ගිවිසුමකින් පරිපූරණය වූ බව පවසන ඔහු,  අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායකගේ නොබැඳි පිළිවෙත උදාහරණයක් ලෙස දක්වමින්, මුල් යුගයේ ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය නොබැඳි බවෙන් පමණක්

විශ්ලේෂණය කිරීම නොකළ යුතු බවද, එක්සත් ජනපද යාත්‍රාවලට ශ්‍රී ලංකාවේ වරායන් වෙත ප්‍රවේශ වීමට අවසරය තිබීම නිදසුනක් ලෙස දැක්වීය. සෝවියට් සංගමයේ බිඳවැටීම වෙසෙසින්ම එක්සත් ජනපදයේ ජයග්‍රහණයක් නොවන බවත්, නැගී එන අභියෝග සඳහා නොබැඳි ජාතීන්ගේ විදේශ ප්‍රතිපත්තිය නැවත අර්ථ දැක්වීමක් අවශ්‍ය බවත් ඔහු අවධාරණය කළේය. වත්මන් ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය ද නොබැඳි බව මත පමණක් විග්‍රහ නොකළ යුතු බවත්, එයට අමතර සැලකිල්ලක් දැක්විය යුතු බවවට අවවාද කළ අතර, දේශීය, දකුණු ආසියානු (ප්‍රධාන වශයෙන් ඉන්දියාව සම්බන්ධ), ඉන්දියානු සාගර කලාපය සහ ගෝලීය සන්දර්භයන් ද සැලකිල්ලට ගත යුතු බව පෙන්වා දුන්නේය.

හිටපු විදේශ කටයුතු ලේකම් සහ පාත්ෆයින්ඩර් පදනමේ සභාපති තානාපති බර්නාඩ් ගුණතිලක මහතා , ජාත්‍යන්තර වේදිකාවේ බහුවිධ ප්‍රවණතා සහ ඉදිරි දශකය තුළ චීනය, එක්සත් ජනපදය සහ ඉන්දියාව විශාලතම ආර්ථිකයන් තුනක් වශයෙන් මතුවීම සහ ගෝලීය ආර්ථිකයේ වර්තමාන දැක්ම ගැන සඳහන් කළේය. ශ්‍රී ලංකාව වැනි රටවලට මෙම ගෝලීය ආර්ථික බලවතුන්ගේ අනුග්‍රහය මත විශ්වාසය තැබිය නොහැකි බවත්, නොබැඳි රටවල් ආර්ථික වාසි සඳහා තමන්ගේම වූ උපාය ස්ථාපිත කරගත යුතු බවත් පැවසීය. එයට නොබැඳි විදේශ ප්‍රතිපත්තිය මනාව සකස් කර ගැනීම අවශ්‍ය බවත්, 120 දෙනෙකුගෙන් යුත් නොබැඳි ව්‍යාපාරය අක්‍රීය වීම වෙනුවට නැවත සමූහගත කර සක්‍රීය කර ගැනීමට අවශ්‍ය බවත් ඔහු පැහැදිලි කළේය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා 2019 අනුරාධපුරයේ පැවති සමාරම්භක උත්සවයේදී මධ්‍යස්ථභාවය වැළඳගෙන මෙම ස්ථාවරය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළද, එම අභිප්‍රාය ප්‍රකාශ කිරීමෙන් ඔබ්බට, සීමිත පසු විපරමක් පමණක් සිදුවී ඇති බව ඔහුගේ නිරීක්ෂණය විය. වසර පහකට පසු, ශ්‍රී ලංකාව මෙම මධ්‍යස්ථ සහ නොබැඳි ස්ථාවරය දිගටම පවත්වාගෙන යන බව අප උපකල්පනය කළ යුතු බව ඔහු පැවසීය. එවැනි තීරණවල දීර්ඝ කාලීන ප්‍රතිවිපාක පිළිබඳ අනවබෝධයෙන්, ජාතීන් තම තමන්ගේ අභිලාෂයන් මත සන්ධාන මාරු කර ගත් ආකාරය ගුණතිලක  මහතා මෙහිදී අවධාරණය කළේය. වෙනස්වන ගෝලීය ගතිකත්වයන් මධ්‍යයේ ශ්‍රී ලංකාව දේශීය අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දෙන අතරෙම  පුළුල් විදේශ ප්‍රතිපත්තියක් සමඟ ජාතිය සවිබල ගැන්වීමට කටයුතු කරන බව සහතික කිරීමේ අවශ්‍යතාවය ද ඔහු යළිත් අවධාරණය කළේය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ (CPA) විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු  මහතා, "නූතන කාලයේ නොබැඳියාව යනු කුමක්ද, ඔබ නොබැඳිව සිටින්නේ කුමක් සඳහා දැයි" ප්‍රශ්න කළේය. ඔහු, වර්තමාන භූ දේශපාලන සන්දර්භයේ සංකීර්ණ බව සියුම් ලෙස අවබෝධ කරගැනීමේ අවශ්‍යතාවය අවධාරණ කරමින්, නොබැඳීව සිටීමේ සාම්ප්‍රදායික සංකල්ප අභියෝගයට ලක් කළේය. දැඩි මතවාදී ස්ථාවරයන් වෙනුවට, සිංගප්පූරුවේ විදේශ ප්‍රතිපත්ති ප්‍රවේශය ඒත්තු ගැන්විය හැකි උදාහරණයක් ලෙස ගෙනහැර දක්වමින්, ස්වයං අභිලාෂය මත ඡන්දය දීම වැනි ප්‍රායෝගික තීරණ ගැනීම නොබැඳි පිළිවෙතක් ලෙස සැලකිය හැකිදැයි ප්‍රශ්න කළේය. එසේම බටහිර නොවන මැදිහත්වීම්වලින් පැන නගින අභියෝග පිළිබඳව NAM යෝජනා ඉදිරිපත් නොකරන බව ද  පැවසූ ඔහු, බල තුලනය චීනය සහ ඉන්දියාව දෙසට මාරු වෙමින් පවතින බැවින්, ශ්‍රී ලංකාව සිය විදේශ ප්‍රතිපත්තිය තක්සේරු කළ යුත්තේ නොබැඳියාවේ සදාචාරාත්මක අධිකාරිය මත පදනම් නොවී, සෙසු ලෝකය සමඟ

සම්බන්ධ වීමෙන් තමන්ට ලබා ගත හැකි දේ මත පදනම්ව බවත් අවධාරණය කළේය. විශේෂයෙන්ම ආර්ථික සමෘද්ධිය සම්බන්ධයෙන් අවධාරණය කළ ඔහු, නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් ආර්ථික වාසි කැප කරගන්නවාට වඩා ඉහළම ආර්ථික ප්‍රතිලාභ ගෙන දෙන රටවල් සමඟ පෙළ ගැසී ශ්‍රී ලංකාව ප්‍රගතිය කරා යෑම අවශ්‍ය බව අවධාරණය කළ්ය.

ෆැක්ටම්හි ප්‍රධාන ජාත්‍යන්තර සම්බන්ධතා විශ්ලේෂක, උදිත දේවප්‍රිය මහතා, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පවා යම් ප්‍රතිවිරෝධතා සහ අපැහැදිලිතාවයන් ඇති කරමින්, නොබැඳි බව නිර්වචනය කිරීමට ප්‍රායෝගිකවාදය සමත්ව ඇතැයි පෙන්වා දුන්නේ ය. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති හා තීරණ බිම් මට්ටමේ වටිනා ඉදිරිදර්ශන මඟහරින බව පෙන්වා දුන් ඔහු, ශ්‍රී ලංකාවේ දකුණ, ද්විපාර්ශ්වික හවුල්කරුවන් සමඟ සම්බන්ධවීමේ අවශ්‍යතාවය අවධාරණය කරන බවත්, උතුර, දෙමළ අයිතිවාසිකම් සහ පිළිගැනීමට ප්‍රමුඛත්වය දෙන විදේශ ප්‍රතිපත්තියක අවශ්‍යතාව සලකන බවත් පවසයි. එසේම මහපොළවේ පය ගසා සිටින ශ්‍රී ලාංකීය ජනතාව විවිධාකර බැඳීම් සහිත ආධාර ලබා දීම ගැන දැඩි සැකයෙන් පසුවන බව වැඩිදුරටත් විස්තර කළේය. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විශ්වාසනීයත්වයක් ඇති, අතීත ප්‍රතිපත්ති සමඟ සමපාත වන ස්ථාවර තීරණ ගන්නා ක්‍රියාකාරී විදේශ ප්‍රතිපත්ති උපාය මාර්ගයක් වෙනුවෙන් ඔහු පෙනී සිටි. මහජන මතය මෙම තීරණවලට බලපෑම් කළ යුතු බවත්, ප්‍රවීණයන් ප්රතිපත්ති සම්පාදකයින් සමඟ වැඩි වැඩියෙන් සම්බන්ධ විය යුතු බවත්, එමඟින් එළැඹෙන තීරණ තිරසාර වන අතරම, දක්ෂිණ ගෝලයෙන් මතු වන පුළුල් අභියෝගවලට විසඳුම් ලබා දිය යුතු බවත් ඔහු ඉල්ලා සිටියේය.

ඉන් අනතුරුව පැවති ප්‍රශ්නෝත්තර සැසියේදී සාකච්ඡා කළ කරුණුවලදී, නොබැඳීව සිටීම සහ මධ්‍යස්ථභාවය එක හා සමානද, ගෝලීය දකුණේ බහුවිධ පෙළගැසීමක් සහිත විදේශ ප්‍රතිපත්තිය යනු කුමක්ද, විදේශ ප්‍රතිපත්ති උපාය මාර්ගයක් ලෙස ප්‍රයෝගිකවාදය සහ ස්වාර්ථය ප්‍රතිපත්තිමය වශයෙන් නොතිබුණේද, එසේ නම් ශ්‍රී ලංකාවේ මෘදු බල මැදිහත්වීම ඕනෑම කරුණක් සාධාරණීකරණය කිරීමට යොදා ගත හැකිද? නොබැඳීව සිටීමට අනුකූල වන අතරම ද්විපාර්ශ්වික සබඳතාවලට අමතර පීඩනයක් ඇති නොකර උපරිම ප්‍රතිලාභ ලබා දෙන පරිපූර්ණ සහ ක්‍රියාශීලී විදේශ ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාව විසින් සකසාගැනීමේ අවශ්‍යතාවය, වැනි කරුණු කාරණා සාකච්ඡාවට බඳුන් විය.